**<u>ගිණුම්කරණය - 5 - මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.</u>**

1.ව්‍යාපාරයක ප්‍රාග්ධන ස්වරූපයේ සුළු වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර ක්ෂය කිරීම කරනු වෙනුවට එවැනි වියදම් හුදෙක් වියදම් වශයෙන් සලකා ගිණුම්ගත කිරීමේ ප්‍රායෝගික තීරණයට පාදක වන සංකල්පය වන්නේ,

1.සංගතතාවය
2.ප්‍රමාණාත්මක සංකල්පය
3.ආරක්ෂණ සංකල්පය
4.ව්‍යාපාර ඒකක සංකල්පය
5.අනාවරණ සංකල්පය

2.ව්‍යාපාර ආයතනයක ඉතා කැපවීමෙන් වැඩ කරන දක්ෂ සේවක පිරිසක් සිටීම මූල්‍ය ප්‍රකාශනවලට නොගැනීමට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1.ආරක්ෂණ සංකල්පය
2.ඓතිහාසික පිරිවැය සංකල්පය
3.ව්‍යාපාර ඒකක සංකල්පය
4.මූල්‍ය මිනුම් සංකල්පය
5.ගැලපුම් සංකල්පය

3.හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමේ දී හා තොග අගය කිරීමේ ක්‍රමය වෙනස් කිරීමේ දී සලකා බැලිය යුතු සංකල්ප පිළිවෙලින්,

1.උපචිත පදනම හා මූල්‍ය මිනුම් සංකල්පය
2.විචක්ෂණ සංකල්පය හා සංගතතා සංකල්පය
3.උපචිත පදනම හා අඛණ්ඩ පැවැත්ම
4.උපචිත පදනම හා සංගතතා සංකල්පය
5.විචක්ෂණ හා මූල්‍ය මිනුම් සංකල්පය

4.අයිතිකරුගේ පෞද්ගලික ජීවිත රක්ෂණය වෙනුවෙන් ගෙවන ලද ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරික වියදමක් නොවේ.මෙයට අදාළ සංකල්පය,

1.විචක්ෂණ සංකල්පය
2.උපචිත සංකල්පය
3.ව්‍යාපාර ඒකක සංකල්පය
4.මූල්‍ය මිනුම් සංකල්පය
5.ගැලපුම් සංකල්පය

5.වත්කම් ප්‍රත්‍යාගණනයෙන් කඩවන සංකල්පය වන්නේ,

1.විචක්ෂණ සංකල්පය
2.උපලබ්ධි සංකල්පය
3.ඓතිහාසික පිරිවැය සංකල්පය
4.ව්‍යාපාර ඒකක සංකල්පය
5.ගැලපුම් සංකල්පය

6.පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත තොග ගණනය කිරීමට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1.ඓතිහාසික පිරිවැය සංකල්පය
2.කාලච්ඡේද සංකල්පය
3.විචක්ෂණ සංකල්පය
4.ගැලපුම් සංකල්පය
5.මූල්‍ය මිනුම් සංකල්පය

7.යම්කිසි කාලච්ඡේදයකට අදාළව විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී අවසාන තොගය අඩුකර දක්වන්නේ කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් කරගෙනද?

1.කාලච්ඡේද සංකල්පය
2.විචක්ෂණ සංකල්පය
3.උපචිත සංකල්පය
4.ගැලපුම් සංකල්පය
5.ව්‍යාපාර ඒකක සංකල්පය

8.අවසන් තොග ගැලපීම හා හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමට අදාළ ගිණුම්කරණ සංකල්ප පිළිවෙලින්,

1.ගැලපුම් හා ඒකක සංකල්ප
2.සංගතතාවය හා ඒකක සංකල්පය
3.විචක්ෂණ හා සංගතතා සංකල්පය
4.ගැලපුම් හා විචක්ෂණ සංකල්පය
5.ගැලපුම් හා සංගතතා සංකල්පය

9.ගිණුම්කරණ සංකල්ප ඇසුරින් හිස්තැන් පුරවන්න.

1.ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ .....................සංකල්පය අනුවය.
2.ව්‍යාපාරයක වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරන්නේ ................................සංකල්පයට අනුවය.
3.අයිතිකරුගේ පෞද්ගලික වියදම් ගැනිලි ලෙස සටහන් කරනුයේ ..........................සංකල්පයට අනුවය.

4.මූල්‍ය ප්‍රකාශන තුළ මුදලින් මැනිය නොහැකි ගනුදෙනු වාර්තා නොකරනුයේ .......................................සංකල්පයට අනුවය.

10. කල්බදු ක්‍රමයට මිලදී ගත් රථයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමක් ලෙස හඳුනා ගැනීමේ පදනම වන්නේ,

1.ව්‍යාපාර ඒකක සංකල්පය
2.ගැලපුම් සංකල්පය
3.යථානුරූපී සංකල්පය
4.ආරක්ෂණ සංකල්පය
5.මූල්‍ය මිනුම් සංකල්පය

**<u>පිළිතුරු</u>**

| | |
|---|---|
| 1.) 2 | 6.)3 |
| 2.) 4 | 7.)4 |
| 3.) 2 | 8.)4 |
| 4.) 3 | |
| 5.) 3 | 10.)3 |

9. 1.)කාලච්ඡේද
   2.) අඛණ්ඩ පැවැත්ම
   3.)ව්‍යාපාර ඒකක
   4.)මූල්‍ය මිනුම්

**<u>සකස් කළේ -</u>**

**කාංචනා ගුණරත්න මිය,**
**ර/රත්නපුර ධර්මපාල ම.වි.**